ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන- හයවන මට්ටම **2017/2018**

අවසාන පරීක්ෂණය - **2019**

ප්‍රාථමික අධ්‍යාපනය - **ESU4117/STU6317**

කාලය පැය තුනයි. **(03)**

---

දිනය - **2019.02.18** වේලාව - ප.ව.**01.30** - ප.ව.**04.30** දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**<u>1 වන කොටස</u>**

01. ළමයාගේ මුල් අවුරුදු පහට (05) ප්ලේටෝ යෝජනා කළ අධ්‍යාපන ක්‍රමය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ප්‍රාථමික අධ්‍යාපනයේ අරමුණු තුනක් **(03)** නම් කරන්න.

03. ප්‍රාථමික අධ්‍යාපන කාලසීමාව ප්‍රධාන අවධි තුනට (03) බෙදා දක්වා ඇත. එම අවධි තුන **(03)** ඊට අදාළ ශ්‍රේණි සමග ලියා දක්වන්න.

04. සමෝධානිත ප්‍රවේශය යන්න පැහැදිලි කරන්න.

05. සන්නිවේදන නිපුණතා අනු කාණ්ඩ හතරක් **(04)** මත පදනම් වේ. එම අනුකාණ්ඩ හතර නම් කරන්න. එම එක් අනු කාණ්ඩයක අන්තර්ගතය ලියා දක්වන්න.

06. තක්සේරුකරණය හා ඇගයීම යන ක්‍රියාවලි දෙක කෙටියෙන් පැහැදිලි කරනන.

07. ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකයකුගේ (සේවාස්ත උපදේශක) කාර්යයන් තුනක් **(03)** ලියන්න. ඉන් එක් කාර්යයක් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ප්‍රාථමික අධ්‍යාපනයේ එක් ප්‍රධාන අවධියක් එක් ගුරුවරයෙකු විසින් උගන්වනු ලබයි. මෙහි යහපත් හා අයහපත් ලක්ෂණ දෙක **(02)** බැගින් ලියන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) "ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ රූසෝගේ අදහස් වර්තමානයට ද ගැළපේ." මෙම කියමන තහවුරු කිරීම සඳහා කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

(ii) මහත්මා ගාන්ධි දර්ශනය ප්‍රාථමික අධ්‍යාපන අවධියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට භාවිත කළ හැකි ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 12)

10. (i) "ප්‍රවේශ නිපුණතා" යන සංකල්පය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) "ගුරුවරයෙකු ඉගැන්වීමට පළමුව ඉගෙන ගනු ලබන දරුවා පිළිබඳ ව හඳුනාගත යුතුයි." ගුරුවරයෙකු විසින් ඉගැන්වීමට පළමු ව ශිෂ්‍යයා හඳුනා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 12)

11. (i) "අභිමත ඉගෙනුම් නිපුණතා" යනු කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) "අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වැඩ සටහන නිර්ණායක මූලික ඇගයීම් ක්‍රමය සඳහා හොඳ උදාහරණයක් වේ." මෙම අදහස උදාහරණ සපයමින් තර්කානුකූලව පැහැදිලි කරන්න. (ලකුණු 12)

12. (i) ප්‍රාථමික (1-5) පන්ති භාර ගුරුවරයෙකුගෙ කළමනාකරණ භූමිකාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ප්‍රාථමික පන්ති භාර ගුරුවරයෙකු පන්ති කාමරය හා අවට පරිසරය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට පහසු වන ලෙස හා නිර්මාණශීලී ලෙස සකස් කරගත යුතු ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. (i) විධිමත් තක්සේරුකරණ ක්‍රම හා අවිධිමත් තක්සේරුකරණ ක්‍රම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) "ප්‍රාථමික අධ්‍යාපන අවධියේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට වඩා වැදගත් වන්නේ අවිධිමත් තක්සේරුකරණ ක්‍රමයයි." මෙම කියමන තහවුරු කිරීම සඳහා කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 12)

14. (i) ප්‍රාථමික අධ්‍යාපන අවධියේ සිසුන්ගේ චිත්තවේග සංවර්ධනයට පන්තිකාමර පරිසරය බලපාන ආකාරය උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) යහපත් චිත්තවේග සිසුන් තුළ වර්ධනය කිරීම සඳහා ගුරුවරයාට මැදිහත් විය හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.